Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# මහව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති, ඒ ඒ තනතුර සම්බන්ධයෙන් දක්වා ඇති සුදුසුකම් සහිත අයගෙන් 2019.01.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *සේවක ගණය* | *තනතුරු ප්‍රමාණ* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|
| 01. වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 06 | 03/2016 PL-1 රු. 24,250- 10 x 250- 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 02. ජල පොම්ප කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | 03/2016 PL-1 රු. 24,250- 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 03. ජල කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | 03/2016 PL-1 රු. 24,250- 10 x 250- 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 04. නළ ළිං පොම්ප කාර්මික | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | 03/2016 PL-1 රු. 24,250- 10 x 250- 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 |

*02. මූලික අධ්‍යාපන සුදුසුකම් (සියලුම තනතුරු සඳහා) :*

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර).

(ආ) මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට එම ප්‍රාථමික ශිල්පීය නොවන තනතුර සඳහා අනියම්/ආදේශක/ කොන්ත්‍රත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින් ට පමණක් පෞද්ලික වශයෙන් එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියෙන් අධ්‍යාපන සුදුසුකම් අදළ වේ.

*වෘත්තීය සුදුසුකම්* : (නළ ලිං පොම්ප කාර්මික තනතුර සඳහා පමණි.

රජයේ කාර්මික විද්‍යාලයකින් හෝ ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ හෝ වෘත්තීය පුහුණු අධිකාරියේ හෝ ජල නළ වැද්දුම් ශිල්පීය පිළිබඳව තුන් මසක හෝ ඊට වැඩි කාලයක පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය. ඉහත පාඨමාලාව අර්ධකාලීන නම්, සම්පූර්ණ පාඨමාලා කාලය මාස 06කට නොඅඩු විය යුතුය.

ii. ජල නළ වැද්දුම් ශිල්පය පිළිබඳව අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(මෙම පළපුරුද්දට අදාළ සහතිකය රජය පිළිගත් ආයතනයකින් විය යුතුය.) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙ ජල නළ වැද්දුම් කටයුතු වල අවුරුදු 03ක් හෝ ඊට වැඩි කාල සීමාවක් යෙදී සිට ඇති දෙපාර්තමේන්තු ස්ථිර සේවකයින් විසින් එසේ ඔවුන් දෙපාර්තමේන්තුවේ ජලනළ වැද්දුම් කටයුතුවල අවුරුදු 03කට හෝ ඊට වැඩි කාල සීමාවක් යෙදී සිටි බව සනාථ කිරීමට ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ දෙපාර්තමේන්ත ප්‍රධානියා අනු අත්සන් කළ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. බාහිර අයදුම්කරුවන් සම්බන්ධයෙන් නම් පළපුරුද්ද (අවුරුදු 3) පිළිබඳව සහතිකය සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවනු ලබන පෞද්ගලික අංශයේ ආයතන ප්‍රධානියාගෙන් විය යුතුය.

03. *වයස :*

සියලුම තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.

**දැනටමත් රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ..........................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.........................වශයෙන් සේවය කරයි. මෙම තනතර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය දැනට දැරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූලව දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

________________________

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————————
පදවි නාමය:————————————
දෙපාර්තමේන්තුව/ආයතනය:————————————
(නිල මුද්‍රාව තබන්න.)
දිනය :————————————

*වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන්/අයදුම්කාරින් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය.

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය අවුරුදු 3 ක් සනාථ කළ යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් සනාථ කළ යුතුය.)

(vi) දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් වයස් සීමාව බල නොපවතින අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

(vii) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මහව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. *අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :*

සියළුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පතක් 2019.01.31 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, මහව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවියයුතුය.

අයදුම්පත බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "........................." තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් ඇමිණිය යුතුය.-

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික/වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික,
3. ජාතික හැඳුනුම්පතේ පිටපතක්,
4. ග්‍රාම නිලධාරි සහතිකය
5. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වූවන් නම් සේවා සහතිකය,
6. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම්,
මහව ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 26 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**................................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (i) මුලකුරු සමග නම :————————————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————

03. ජාතික හැඳුනුම්පත් අංකය :————————————

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ————————————

05. උපන් දිනය :

අවුරුද්ද :———— මාසය :———— දිනය :————

06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු :———— මාස :———— දින :————

07. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගය: වර්ෂය:——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |
| .................................... | ..................... |

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

————————————

අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————————